## **10** වැනි පරිශිෂ්ටය
## (XII – 16:5)

# එතෙර වෛතනික කාර්ය පැවරුමක් සඳහා/එතෙර රැකියාවක් බාර ගැනීම සඳහා වැටුප් රහිත නිවාඩු දෙනු ලබන නිලධරයන් අත්සන් කළ යුතු ගිවිසුමේ ආකෘතිය

(ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමතිය නොමැතිව මෙම ආකෘතිය සංශෝධනය නොකළ යුතු ය)

(මෙහි මින්මතු නිලධරයා යනුවෙන් සඳහන් කෙරෙන) (1) ------------------ නමැත්තා එක් පක්ෂයකට ද (මෙහි මින්මතු ආණ්ඩුව යනුවෙන් සඳහන් කෙරෙන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සඳහා සහ වෙනුවෙන් ක්‍රියා කරන (මෙහි මින්මතු (2)-------------------- යනුවෙන් සඳහන් කෙරෙන) ශ්‍රී ලංකාවේ (2)--------- ----------------- තනතුර දරන (3) ------------------------ අනෙක් පක්ෂයට ද බැඳී ((2)------------------------ තනතුර දරන එකී (3)------------------ ගෙන් පසු එම තනතුරට තත්කාලීනව පත්වන ඔහුගේ අනුප්‍රාප්තිකයෝ ද (2)---------------- යන පාඨයට ඇතුළත් වන්නාහ.) එම දෙපක්ෂය විසින් වර්ෂ දෙදහස් ---------------- ක් වූ ---------------- මස ----------------- වැනිදා වන මෙදින ලියා අත්සන් කරනු ලබන ගිවිසුම් පත්‍රයයි. (5)----------------------- ට ගොස් (6)------------------ කාර්ය පැවරුමක්/රැකියාවක් භාර ගැනීමට හැකිවනු පිණිස එකී නිලධරයා මුල් වතාවට මාස (4)------------- කාලයක් සඳහා වැටුප් රහිත නිවාඩු ඉල්ලා ඇති හෙයින් ද,

එසේම ඒ සඳහා එකී නිලධරයාට 20-------------වැනිදා පටන් මාස (4)------------ කාලයක් වැටුප් රහිත නිවාඩු දීමට ආණ්ඩුව එකඟ වී ඇති හෙයින් ද,

දැන් මේ ලියා අත්සන් කරන ගිවිසුමේ වග හැටි නම් මෙසේ ය:-

(1) (5) ----------------- ට ගොස් (6) -------------------- කාර්ය පැවරුමක්/රැකියාවක් බාර ගත හැකිවනු පිණිස යථෝක්ත නිලධරයාට 20-------- වැනිදා පටන් මාස (4) ------------------- ක වැටුප් රහිත නිවාඩු අනුමත කිරීමට ආණ්ඩුව එකඟ වෙයි.

(2) එකී නිලධරයා-

(i) ඉහත කී වැටුප් රහිත නිවාඩු අනුමත කිරීමට හේතු වූ කාර්ය පැවරුමට/රැකියාවට අදාළ කටයුතු අනලස්ව නොපිරිහෙලා ඉටු කරන බවට ද,

(ii) වැටුප් රහිත නිවාඩු පිට සිටින කාලය තුළ එකී (3)---------------- ගේ පූර්වානුමතිය නොලබා තම කාර්ය පැවරුම/රැකියාව වෙනස් කිරීම හෝ එම කාර්ය පැවරුමේ/රැකියාවේ කාලය කෙටි කිරීම හෝ එකී වැටුප් රහිත නිවාඩුවෙන් ඉතිරිව ඇති කිසිම කාල පරිච්ඡේදයක් වෙනත් කිසිම කාර්යයක් සඳහා යොදා ගැනීම හෝ නොකරන බවට ද,

(iii) ඉහත කී වැටුප් රහිත නිවාඩු කාලය අවසන් වීම ය, එසේ නැතහොත් ඉහත සඳහන් කාර්ය පැවරුම/රැකියාව අවසන් වීම ය යන දෙකින් කුමක් හෝ පළමුවෙන් සිදු වූ වහාම ශ්‍රී ලංකාවට ආපසු පැමිණ, ආණ්ඩුව කරන තීරණය අවසාන තීරණය හැටියට පිළිගැනීමට බැඳෙමින් ආණ්ඩුව නියම කරන පරිදි කිසියම් පදවියක වැඩ බාරගෙන, එසේ වැඩ බාරගත් දින සිට මාස (7)------------------ කට නොඅඩු කාලයක් ආණ්ඩුව යටතේ සේවය කිරීමට බැඳෙන බවට ද,

(1) නිලධරයාගේ සම්පූර්ණ නම සහ පදවි නාමය

(2) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පදවි නාමය

(3) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සම්පූර්ණ නම

(4) වැටුප් රහිත නිවාඩු පිට සිටින කාලය

(5) කාර්ය පැවරුම/රැකියාව බාර ගැනීමට යන රට

(6) කාර්ය පැවරුම/රැකියාවේ ස්වභාවය

(7) අනිවාර්ය සේවා කාලය (මෙය ගණන් බැලිය යුත්තේ XII වැනි පරිච්ඡේදයේ 16:15 උප වගන්තියට අනුව ය.)

(iv) තමාට අනුමත කරන ලද වැටුප් රහිත නිවාඩුව අවසන් වූ විට ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමට අපොහොසත් වුවහොත් හෝ ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමෙන් පසු ඉහත සඳහන් පරිදි ආණ්ඩුව යටතේ වැඩ බාර ගැනීමට අපොහොසත් වුවහොත් හෝ ඉහත සඳහන් පරිදි ආණ්ඩුව යටතේ වැඩ බාර ගැනීමෙන් පසු වැඩ භාර ගත් දින සිට යටත් පිරිසෙයින් මාස (7)---------------------- ක් වත් සේවය කිරීමට අපොහොසත් වුවහොත් හෝ ඉහත සඳහන් පරිදි වැඩ බාරගත් පසු එකී මාස (7)------------------------ක කාලය අවසන්වීමට පෙර අකාර්යක්ෂමතාව නිසා හෝ වියදම් අඩු කිරීමේ හේතුව හැරුණු විට වෙනත් යම්කිසි හේතුවක් නිසා හෝ සේවයෙන් පහකරනු ලැබුවහොත් නැතහොත් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ එසේ නැතහොත් මෙම ගිවිසුමේ අනෙකුත් කොන්දේසි අතුරින් කිසිවක් පිළිපැදීමට අපොහොසත් වුවහොත් එවිට තමා ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් (8)------------------------- ක් ආණ්ඩුවට ගෙවන බවට ද, මෙයින් එකඟ වෙයි.

(8) දණ්ඩන මුදල (මෙය ගණන් බැලිය යුත්තේ XV වැනි පරිච්ඡේදයේ 5:2 උප වගන්තියට අනුව ය.)

(3) තමාට දෙන ලද වැටුප් රහිත නිවාඩු කාලය දීර්ඝ කරන ලෙස එකී නිලධරයා ඉල්ලා සිටි විටකදී ආණ්ඩුවේ හුදු අභිමතය අනුව එම වැටුප් රහිත නිවාඩු කාලය වරින් වර දීර්ඝ කිරීමට ආණ්ඩුවට පුළුවන් බවට ද, පාර්ශ්වකරුවන් අතරේ මෙයින් තවදුරටත් ගිවිස ගනු ලැබේ.* එතෙකුදු වුවත්, වැටුප් රහිත නිවාඩු කාලය එසේ දීර්ඝ කරනු ලබන කල්හි, නැවත වැඩ බාර ගැනීමෙන් පසු සේවය කළ යුතු අවම අනිවාර්ය සේවා කාලය ආණ්ඩුව තීරණය කරන තවත් අමතර කාලයකින් ද, එසේම මෙම ගිවිසුමේ කොන්දේසි කඩ කළහොත් යථෝක්ත නිලධරයා ගෙවිය යුතු මුදල ආණ්ඩුව තීරණය කරන තවත් අමතර මුදලකින් ද සමානුපාතිකව වැඩි කළ යුතු වන්නේ ය.*

(4) වැටුප් රහිත නිවාඩු කාලය ඒ ආකාරයෙන් දීර්ඝ කිරීමෙන් ඉක්බිති නිලධරයා සේවය කිරීමට බැඳී සිටිය යුතු අවම අනිවාර්ය සේවා කාලයත්, මෙම ගිවිසුමේ කොන්දේසි කඩ කළහොත් නිලධරයා ගෙවිය යුතු වූ මුදලත් සමානුපාතිකව වැඩි කරනු ලබන අවස්ථාවක දී, මෙම ගිවිසුමේ දැනට සඳහන්ව ඇති වැටුප් රහිත නිවාඩු කාල සීමාව, අනිවාර්ය සේවා කාලය සහ නිලධරයා ගෙවිය යුතු වන මුදල යන මේවා වෙනුවට එකී වැටුප් රහිත නිවාඩු කාල සීමාවන්හි මුලු එකතුව ද, අනිවාර්ය සේවා කාල පරිච්ඡේදයන්හි මුලු එකතුව හා නිලධරයා ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන්හි මුලු එකතුව ද මේ ගිවිසුමේ ඊට අදාළ වගන්තිවල පිළිවෙළින් ඇතුළත් කොට ඇත්තා සේ සලකා මෙම ගිවිසුම කියවීමටත් එසේම තේරුම් ගැනීමටත් මෙයින් ගිවිස ගනු ලැබේ. *

(5) පුහුණුව අවසන් කිරීමෙන් හෝ වැටුප් රහිත නිවාඩුව ඊට කලින් අවසන් වීමෙන් හෝ පසුව නිලධරයා ශ්‍රී ලංකාවට ආපසු පැමිණි විට ඉහත සඳහන් මාස (7)---------------------ක කාලයකට ඔහු සේවයේ නියුක්ත කරවා ගැනීමට ආණ්ඩුව බැඳී සිටින බවක් මෙහි සඳහන් කිසිවකිනුත් අදහස් කෙරෙතැයි නොසැලකිය යුතු ය.

(6) ඉහත කී 2, 3 හා 4 වගන්තිවල සඳහන් කවර කරුණක් පිළිබඳව වුවද (3)---------------------------- විසින් හෝ ඔහු වෙනුවට හෝ අත්සන් කරන ලද සහතිකයක්, එහි අඩංගු කරුණු හෝ එහි තබා ඇති අත්සන හෝ ඔප්පු කිරීම සඳහා අතිරේක හෝ වෙනත් සාධක නොමැතිව බැලූ බැල්මට පිළිගැනෙන සාක්ෂියක් වන බවට මෙයින් ගිවිස ගනු ලැබේ.

(7) (3)----------------------------- යන පාඨයෙන් අදහස් කෙරෙන්නේ (3)--------------------------- තනතුර දරන්නා වූ හෝ එම තනතුරේ වැඩ බලන්නා වූ හෝ දැනට (3) ------------------- විසින් කරනු ලබන කාර්යයන් එවකට ඉටු කරන්නා වූ හෝ නිලධරයා ය.

මීට සාක්ෂි වශයෙන් මේ ලියවිල්ලට සම්බන්ධ වන දෙපක්ෂය විසින් වර්ෂ දෙදහස් ------------------- ක් වූ ---------------- මස ---------------- වැනි දා වන මෙදින ----------------------- දී අත්සන් කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සඳහා සහ වෙනුවෙන් එකී (3)-----------------------තනතුර දරන (2) -------------------- විසින් පහත සඳහන් අය ඉදිරිපිට දී අත්සන් කරන ලද බවට-

අත්සන --------------------

පදවි නාමය (3) ------------

**සාක්ෂිකරුවෝ:-**

1. අත්සන : --------------------
   නම : --------------------
   ලිපිනය : --------------------

2. අත්සන : --------------------
   නම : --------------------
   ලිපිනය : --------------------

එකී ------------------------------ විසින් පහත සඳහන් අය ඉදිරිපිට දී අත්සන් කරන ලද බවට -

--------------------
අත්සන

**සාක්ෂිකරුවෝ :-**

1. අත්සන : --------------------
   නම : --------------------
   ලිපිනය : --------------------

2. අත්සන : --------------------
   නම : --------------------
   ලිපිනය : --------------------

*සටහන - (1) නිලධරයෙකුගේ වැටුප් රහිත නිවාඩු කාලය, ගිවිසුම් පත්‍රයෙහි මුලදී සඳහන් කරන ලද කාලය ඉක්මවා දීර්ඝ කරනු ලබන විට ඊට සමානුපාතිකව අනිවාර්ය සේවා කාලයත්, දණ්ඩන මුදලත් (XII) වැනි පරිච්ඡේදයේ 15:6 උප වගන්තියේ සඳහන් කර ඇති අයුරින් වැඩි කළ යුතු ය.

(2) දීර්ඝ කරන ලද අනිවාර්ය සේවා කාලයත්, වැඩි කරන ලද දණ්ඩන මුදලත් නිවාඩු දීර්ඝ කරනු ලබන අවස්ථාවේම නිලධරයාට දන්වා ඊට ඔහුගේ කැමැත්ත ලියවිල්ලකින් ලබාගෙන එය ගිවිසුමත් සමග ගොනු කර තැබිය යුතු ය.